සියලු ම හිමිකම් ඇවිරිණි

All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

தென் மாகாணத் கல்வித் திணைக்களம்

Department of Education – Southern Province

32 | S | I

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021

General Certificate of Education (Advanced Level) Examination - 2021

තෙවන වාර පරීක්ෂණය - 2021

Third Term Test – 2021

13 ශ්‍රේණිය Grade 13	ව්‍යාපාර අධ්‍යයනය - I Business Studies – I	පැය දෙකයි 02 hours

සැලකිය යුතුයි :

- **ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති කිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**
- **ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් වන්නේ සිද්ධි කිහිපයකි.

A - කුමාරි බිම්මල් වගා කර විකිණීම
B - තමරා තම ගෙවත්තේ එළවළු වගා කර දිනපතා පරිභෝජනයට ලබා ගනියි
C - සුපුන් තමා සතු ඉඩමක් තම මාමාට විකිණීම
D - කුමාර අභ්‍යාස පොත් තොග වශයෙන් මිලදී ගෙන සිල්ලර වෙළෙඳසැල් වලට විකුණයි

ඉහත සිද්ධි අතරින් ව්‍යාපාර ගතිලක්ෂණ පිළිබිඹුවන සිද්ධි පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. A හා B
2. B හා C
3. C හා D
4. A හා C
5. A හා D

(…….)

02. පහත වගුවේ ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව කිහිපයක් හා ව්‍යාපාරවල සමාජ වගකීම් කිහිපයක් දක්වා ඇත.

උනන්දුවක් දක්වන පාර්ශව	සමාජ වගකීම
1 - රජය 2 - ගණුදෙනුකරුවන් 3 - සැපයුම්කරුවන් 4 - ප්‍රජාව 5 - සේවකයන්	A - සමානාත්මතාව B - නියමිත පරිදි ගෙවීම් සිදු කිරීම C - නිසි ලෙස බදු ගෙවීම D - සාධාරණ වීම E - අපද්‍රව්‍ය කළමනාකරණය

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් හා එම පාර්ශවයන් වෙනුවෙන් ඉටුවිය යුතු සමාජ වගකීම නිවැරදිව ගලපා ඇති වරණය වන්නේ,

1. 1-C, 2-B, 3-D, 4-E, 5-A
2. 1-B, 2-C, 3-A, 4-E, 5-D
3. 1-A, 2-B, 3-D, 4-C, 5-E
4. 1-C, 2-D, 3-B, 4-E, 5-A
5. 1-B, 2-C, 3-D, 4-E, 5-A

(…….)

03. නිෂ්පාදන ආයතනයකට ආචාරධර්ම පද්ධතියක් සකස් කර දෙන ලෙස එම ආයතනය ඔබගෙන් ඉල්ලා ඇත. එම ආචාරධර්ම පද්ධතිය සකස් කිරීමේ දී ඔබ විසින් සෘජුවම සලකා බලන සාධක වන්නේ,

1. ගණුදෙනුකරුවන්, සේවකයින්, තරඟකරුවන්, නිෂ්පාදන පිරිවැය
2. ගණුදෙනුකරුවන්, සමාජ සංස්කෘතිය, ප්‍රායෝගික බව, තරඟකරුවන්
3. ගණුදෙනුකරුවන්, සේවකයන්, සමාජ සංස්කෘතිය, ජීවන වියදම
4. සේවකයන්, ආදේශ භාණ්ඩ නිපදවන්නන්, කළමණාකරුවන්, ව්‍යාපාර සැලසුම්
5. සේවකයින්, තරඟකරුවන්, සංවිධාන සංස්කෘතිය, නිෂ්පාදන පිරිවැය (…….)

04. පහත දැක්වෙන්නේ රජය ව්‍යාපාරවලට බලපෑම් කරන විවිධ ආකාරයන්ට උදාහරණ කිහිපයකි.

A - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
B - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
C - විදුලි බලය සැපයීම
D - මාර්ග නඩත්තුව
E - මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
F - පෞද්ගලික බස්රථ සඳහා නීතිරීති පැනවීම

මේ අතරින් පළාත් සභා මඟින් ව්‍යාපාරවලට බලපෑම් කරන ආකාරය දැක්වෙන උදාහරණ අඩංගු වරණය වන්නේ,

1. D, C, B
2. D, E, F
3. A, D, F
4. A, C, E
5. C, D, E (…….)

05. සමන් රත්නායක මහතා "පැලවත්ත තේ සමාගම පී.එල්.සී" ආයතනයේ කළමනාකරුවෙකු ලෙස සේවය කරයි. එම සමාගමේ නම නිරීක්ෂණය කිරීමේදී ඔබට නිගමනය වන්නේ,

1. මහජනයාට ප්‍රසිද්ධියේ කොටස් අලෙවි කළ නොහැකි සමාගමකි.
2. ණයකර නිකුත් කර මුදල් රැස්කර ගත් පොදු සමාගමකි.
3. කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි කරන ලද පොදු සමාගමකි.
4. තේ නිපදවා අපනයනය කරන පොදු සමාගමකි.
5. කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි නොකළ පොදු සමාගමකි. (…….)

06. වරලත්හිමියාට හා වරලත්ලාභියාට ව්‍යාපාර ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - පුරස්කාරකයක් හිමි වේ
B - ව්‍යාපාරය පුළුල් වීම
C - විශාල වෙළෙඳපොළක් ලබාගත හැකි වීම
D - වරලත් ගිවිසුමකට අනුව වගකීම් සපුරාලීම
E - අසාර්ථක වීමේ ප්‍රවනතාව අඩු වීම
F - මූල්‍ය පහසුකම් ලබාගත හැකි වීම

ඉහත ප්‍රතිලාභ අතුරෙන් වරලත්හිමියාට හා වරලත්ලාභියාට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම දක්වා ඇති පිළිතුර වන්නේ,

	වරලත්හිමියා	වරලත්ලාභියා
1.	A, C, F	B, D, E
2.	C, D, F	A, B, E
3.	A, B, D	C, E, F
4.	B, E, F	A, C, D
5.	A, B, C	D, E, F

(…….)

07. කුමාරි කාන්තා අත්බෑග් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතරතුර එම ව්‍යාපාරය තවත් පුළුල් කිරීමට අදහස් කරනු ලබයි. ඒ සඳහා ඇයට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග දෙකක් පහත දැක්වේ.

A - වෙනත් කාන්තා අත්බෑග් නිෂ්පාදනය කරන ආයතනයක් සමඟ සම්බන්ධ වීම.

B - හම් නිෂ්පාදන කරන ව්‍යාපාරයක් හා කාන්තා අත්බෑග් අලෙවිකරණ ව්‍යාපාරයක් සමඟ සම්බන්ධ වීම.

ඉහත A හා B ක්‍රියාමාර්ග පිළිවෙලින් අයත්වන ඒකාබද්ධවීමේ උපාය මාර්ග දෙක කුමක්ද?

1. විෂම හා සිරස්
2. තිරස් හා සිරස්
3. තිරස් හා විෂම
4. සිරස් හා විෂම
5. සිරස් හා තිරස් (…….)

08. පහත සඳහන් සම්බන්ධතා අතරින් වඩාත් නිවැරදි සම්බන්ධතාවය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අවස්ථාව ⟶ ගැටලුව ⟶ අදහස
2. අදහස ⟶ අවස්ථාව ⟶ ගැටලුව
3. අවස්ථාව ⟶ අදහස ⟶ ගැටලුව
4. ගැටලුව ⟶ අදහස ⟶ අවස්ථාව
5. අදහස ⟶ ගැටලුව ⟶ අවස්ථාව (…….)

09. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා වූ යෝජනා ක්‍රම හා ඒවාට සම්බන්ධ ආයතන කිහිපයක් පහත වගුවේ දැක්වේ.

යෝජනා ක්‍රමය	ආයතනය
1. සහනාධාර	A. ශ්‍රී ලංකා මහ බැංකුව
2. සුවන	B. ආසියානු සංවර්ධන බැංකුව
3. සෞභාග්‍යා	C. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. ලිය ඉසුර	D. කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය
5. ඉසුරු	E. අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව

ඉහත දී ඇති යෝජනා ක්‍රම අනුපිළිවෙළ අනුව ඊට අදාළ ආයතනය නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. 1-E, 2-A, 3-C, 4-B, 5-D
2. 1-B, 2-E, 3-A, 4-C, 5-D
3. 1-B, 2-A, 3-C, 4-D, 5-E
4. 1-A, 2-E, 3-B, 4-D, 5-C
5. 1-E, 2-B, 3-A, 4-D, 5-C (…….)

10. පුද්ගලයෙක් රුපියල් ලක්ෂ 5 ක් මුදලින් ගෙවා ඉතිරිය සමාන වාරිකවලින් ගෙවීමේ කොන්දේසිය මත ෆිනෑන්ස් සමාගමක් හා සම්බන්ධව වාහනයක් මිලදී ගන්නා ලදි. වාහනයේ මුළු වටිනාකම රුපියල් ලක්ෂ 15 ක් විය. මෙම ප්‍රකාශයේ අඩංගු මුදලේ කාර්යයන් වන්නේ,

1. වටිනාකම මැනීමයි.
2. වටිනාකම මැනීම, විනිමය මාධ්‍යයක් වීම.
3. වටිනාකම මැනීම, විනිමය මාධ්‍යයක් වීම, වටිනාකමේ සංනිධියක් වීම.
4. වටිනාකම මැනීම, විනිමය මාධ්‍යයක් වීම, විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම.
5. වටිනාකම මැනීම, විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම. (…….)

11. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරන කාර්යයන් කිහිපයකි.

A - මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම
B - රාජ්‍ය ණය කළමනාකරණය
C - විදේශ විනිමය පාලනය
D - රජයේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කිරීම
E - සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණයය කිරීම
F - ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් යනාදිය සම්බන්ධීකරණය කිරීම

ඉහත සඳහන් කාර්ය අතුරින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරන නියෝජ්‍යායතන කටයුතු දැක්වෙන කාණ්ඩය තෝරන්න.

1. A, B, C, D
2. A, B, D, F
3. A, B, E, F
4. B, C, D, E
5. B, C, E, F (…….)

12. අවදානම් කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යාපාරයක් දිගින් දිගටම පාඩු ලැබීම
B - ණය ගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබී යාම
C - ශිෂ්‍යයෙකු අ.පො.ස. උ.පෙළ විභාගය සමත් වුවද සරසවි වරම් නොලැබීම
D - නිෂ්පාදනයේ නිමාව හා මාදිලිය වෙනස් වීම, මෝස්තරය යල්පැන යාම නිසා ඇතිවන අවදානම
E - ස්වාභාවික සංසිද්ධීන් නිසා ඇතිවන යල්පැනීම, ක්‍ෂය වීම

මේ අතුරින් රක්‍ෂණය කළ හැකි අවදානම් ලෙස සැලකිය හැක්කේ,

1. A පමණි
2. B හා C පමණි
3. D පමණි
4. A, C හා D පමණි
5. B පමණි (…….)

13. සන්නිවේදන මාධ්‍යවල දැකිය හැකි වාසි කිහිපයක් පහත දැක්වේ.

A - තොරතුරු යවන්නා හා ලබන්නා සම්මුඛ වීම
B - වඩාත් විස්තරාත්මකව ඉදිරිපත් කළ හැකි වීම
C - තොරතුරු ඉතා ඉක්මනින් රහසිගතව ඉදිරිපත් කළ හැකි වීම
D - තොරතුරු කෙටියෙන් පැහැදිළිව ඉදිරිපත් කළ හැකි වීම
E - තොරතුරු සන්නිවේදනය කළ බවටත් ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිතා කළ හැකි වීම

ඉහත වාසි අතර ලිඛිත සන්නිවේදනයේ වාසි පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.

1. A හා C
2. B, C හා E
3. B හා E
4. B හා D
5. A, B හා E

(…….)

14. ගබඩාවකට තොග ලැබීමේ සිට තොග නිකුත් කරන අවස්ථාව දක්වා සිදුවන ක්‍රියාවලිය විවිධ අවස්ථා පහතින් දැක්වේ.

A - නිවැරදි බව තහවුරු කිරීම
B - තොග නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම
C - තොග ලැබීම
D - ගුණත්වයය තහවුරු කිරීම
E - තොග හඳුනා ගැනීම
F - ඉවතින් තැබීම
G - පරීක්ෂා කිරීම

එම ක්‍රියාවලිය අනුපිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. C, G, A, D, F, E, B
2. A, B, C, D, E, F, G
3. B, C, D, E, G, F, A
4. G, C, B, D, F, A, E
5. C, E, G, A, D, F, B

(…….)

15. සිල්ලර වෙළඳාමේ හා තොග වෙළඳාමේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - විවිධ වර්ගයේ භාණ්ඩ රැසක් අලෙවියට ඉදිරිපත් කරයි
B - අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කරයි
C - වෙළඳපොළ පර්යේෂණ සිදු කරයි
D - පාරිභෝගිකයා සමඟ සමීප සම්බන්ධතා පවත්වයි
E - භාණ්ඩ තොග ප්‍රවාහනය කර දෙයි
F - බොහෝවිට ණය පදනම මත භාණ්ඩ අලෙවි කරයි

ඉහත ලක්ෂණ සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම සම්බන්ධව දැක් වූ විට නිවැරදි පිළිතුර නම්,

1. A, B, E සිල්ලර වෙළඳාම වන අතර, C, D, F තොග වෙළඳාම වේ.
2. A, D, F සිල්ලර වෙළඳාම වන අතර, B, C, E තොග වෙළඳාම වේ.
3. C, D, F සිල්ලර වෙළඳාම වන අතර, A, B, E තොග වෙළඳාම වේ.
4. B, C, D සිල්ලර වෙළඳාම වන අතර, A, E, F තොග වෙළඳාම වේ.
5. B, D, F සිල්ලර වෙළඳාම වන අතර, A, C, E තොග වෙළඳාම වේ.

(…….)

16. විදේශ වෙළඳාමේ දී භාවිතා වන හානි රක්ෂණ ලිපිය යන්නෙන් අදහස් වන්නේ,

1. රේගුවට භාණ්ඩ භාරදුන් පසු එම භාණ්ඩ බාරගත් බව සඳහන් කරමින් රේගුව විසින් අපනයනකරුට නිකුත්කරන ලියවිල්ලයි.

2. අපනයනකරු අපනයනය කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් අපනයන රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල වේ.

3. දුෂ්‍ය නෞභාර පත්‍රයක් නිකුත් කිරීමේ තත්ත්වයක් ඇති අවස්ථාවක එම තොගයේ සියලු අවදානම් අපනයනකරු භාරගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞභාර පතක් ලබා ගැනීමට අපනයනකරු නැවේ කපිතාන් වෙත ඉදිරිපත් කරන ලියවිල්ලයි.

4. අපනයනයට අදාළ භාණ්ඩ තොගය අපනයන කිරීමේ දී එම තොගය රක්ෂණය කර අපනයනකරු හෝ අපනයනකරු ලබාගන්නා රක්ෂණ සහතිකයයි.

5. ආනයන රටේ අවශ්‍යතාව මත යම් රටක් අපනයනය කරන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් එම රටේ පිළිගත් ආයතනයක් නිකුත් කරන ලියවිල්ල වේ.

(…….)

Past Papers Wiki

17. කළමනාකරුවෙකුගේ විවිධ භූමිකා යටතේ කෙරෙන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - නායකයා වශයෙන් කටයුතු කිරීම
B - ගැටලු සමනයකට පත්කරන්නෙකු වශයෙන් කටයුතු කිරීම
C - මාධ්‍ය ප්‍රකාශකයෙකු වශයෙන් කටයුතු කිරීම
D - සම්පත් බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම
E - නියාමකයෙකු ලෙස කටයුතු කිරීම
F - කේවල් කරන්නෙකු ලෙස කටයුතු කිරීම

කළමනාකරුවෙකු තොරතුරු භූමිකාව යටතින් ඉටුකරනු ලබන කාර්යයක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A, B හා E පමණි
2. B හා D පමණි
3. A හා E පමණි
4. B, D හා F පමණි
5. C හා F පමණි

(.....)

18. පාරිභෝජනයට නුසුදුසු ටින් මාළු තොගයක් ඇති බවට ලැබුණ තොරතුරක් අනුව අදාළ ව්‍යාපාරයට ඇතුල්වී එය පරීක්ෂා කිරීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා තම කණ්ඩායම සමඟ එක් වී එම කාර්ය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.
ඔහුට එසේ කිරීමට හැකියාව ඇත්තේ,

1. දඬුවම්දීමේ බලය නිසාය
2. බලපෑම් කිරීමේ බලය නිසාය
3. ඔහුට ඇති විශේෂණ බලය නිසාය
4. අධිකාරී බලය නිසාය
5. පෞරුෂත්ව බලය නිසාය

(.....)

19. ව්‍යාපාර ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලින් අත්වන ප්‍රතිලාභ ලෙස පිළිගත නොහැක්කේ මින් කවරෙක්ද?

1. නිෂ්පාදන පිරිවැය අඩුකර ගත හැකි වීම
2. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම
3. නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීමට හැකි වීම
4. අපතය අවම කිරීමට හැකි වීම
5. ද්‍රව්‍ය හා සේවකයන් චලනය වීමේදී ඇති විය හැකි බාධා අවම වීම

(.....)

20. රඳවාගැනීමේ පිරිවැය අවමකර ගත හැකි ක්‍රමයක් ලෙස හඳුනාගත හැක්කේ,

1. කාර්ය නිෂ්පාදනය
2. කාණ්ඩ නිෂ්පාදනය
3. JIT ක්‍රමය
4. CAD ක්‍රමය
5. ඉහත කිසිවක් නොවේ

(.....)

21. භාණ්ඩ නිෂ්පදනය කරන ආයතනයක මිලදී ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රථම පියවර වන්නේ,

1. අලෙවිකරණ දෙපාර්තමේන්තුවට දැනුම් දීමයි
2. ද්‍රව්‍යවල මිල ගණන් විමසීමයි
3. ද්‍රව්‍ය අවශ්‍යතාව මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවට දැනුම් දීමයි
4. සැපයුම්කරුවෙකු සොයා ගැනීමයි
5. ද්‍රව්‍ය ඇනවුම් කිරීමයි

(.....)

22. නිෂ්පාදන ක්‍රියාවලිය, අවශ්‍ය යන්ත්‍රාගාර හා යන්ත්‍ර උපකරණ, නිෂ්පාදන කාල සටහන්, අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය ද්‍රව්‍යවල ප්‍රමාණය හා ගුණත්වය ආදිය තීරණය කිරීම,

1. මෙහෙයුම් කළමනාකරණයයි
2. නිෂ්පාදන පාලනයයි
3. කම්හල් පිරියත සැලසුම් කිරීමයි
4. නිෂ්පාදන සැලසුම්කරණයයි
5. නිෂ්පාදන ඉංජිනේරුකරණයයි

(.....)

23. වටිනාකම යනු පාරිභෝගික අවශ්‍යතා ඉටුකිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව පිළිබඳව පාරිභෝගිකයා විසින් කරනු ලබන සමස්ත ඇගයීමයි. එම සමස්ත ඇගයීම සඳහා සැලකිල්ලට ගනු ලබන්නේ මින් කුමන සාධකයන්ගේ වැඩිවීමක්ද?

1. නිෂ්පාදිතයක ගුණත්වය, සේවා හා මිල
2. නිෂ්පාදිතයක මිල, සේවා හා බෙදාහැරීම
3. තඟකාරීත්වය, මිල හා ප්‍රවර්ධනය,
4. නිෂ්පාදිතයක ගුණත්වය, ආරක්ෂාව හා මිල
5. නිෂ්පාදිතයක ගුණත්වය, ප්‍රවර්ධනය හා බෙදාහැරීම (…….)

24. අලෙවිකරණය අනුව වෙළෙඳපොළ යන්නට වඩාත් සමීප අදහස වන්නේ,

1. ගැණුම්කරු විසින් තම පෞද්ගලික පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා ඉල්ලුම් කරන ස්ථානය වෙළඳපොළයි.

2. නිෂ්පාදිතයක් සඳහා සත්‍ය හා විභව ගණුදෙනුකරුවන් සියල්ලගේ එකතුව වෙළඳපොළයි.

3. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වන ඕනෑම ස්ථානයක් වෙළඳපොළයි.

4. ව්‍යාපාරික ස්ථානවලට අවශ්‍ය විවිධ භාණ්ඩ හා සේවා හුවමාරුවන ඕනෑම ස්ථානයක් වෙළඳපොළයි.

5. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර ගණුදෙනු සිදුවන ඕනෑම අවකාශයක් වෙළඳපොළයි.

(…….)

25. පහත මූල්‍ය කළමනාකරණ තීරණ අතරින් කෙටිකාලීන ආයෝජන තීරණයක් වන්නේ කුමක් ද?

1. වෙළඳ ණයහිමියන් පිළිබඳ තීරණ
2. ව්‍යාපාරය නවීකරණය පිළිබඳ තීරණ
3. ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ
4. මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
5. ව්‍යාපාරය විවිධාංගීකරණය පිළිබඳ තීරණ (…….)

26. සංචිත ප්‍රාග්ධනීකරණයේදී,

A - සමාගම සතුව පවතින සංචිත කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරීමත් සිදුවේ.
B - සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වැඩිවීමක් සිදු නොවේ.
C - සමාගම සතුව පවතින වරණීය කොටස්, සාමාන්‍ය කොටස් බවට පත් කිරීමත් සිදුවේ.
D - සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වැඩිවීමක් සිදුවේ.
E - දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට යම් අනුපාතයක් අනුව නව කොටස් ලබාදීමත් සිදුවේ.

මේ අතරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

1. A B E
2. B D E
3. A C D
4. B C D
5. A D E (…….)

27. මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - අනාගත සේවක අවශ්‍යතා නිගමනය කිරීම
B - මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම
C - රැකියාවට අදාළ කාර්යයන් හඳුනාගැනීම
D - රැකියා ඉල්ලුම් පත් සැකසීම
E - සේවක පිරිවැය පාලනය

මේවා අතරෙන් මානව සම්පත් සැලසුම්කරණයට අදාළ කාර්යයන් අඩංගු පිළිතුර තෝරන්න.

1. A B C
2. A C D
3. A B E
4. C D E
5. B C D (…….)

28. ස්ථීර සේවයට බඳවාගත් සේවකයකු ඔහුගේ/ ඇයගේ තනතුරෙහි තහවුරු කිරීමට පෙර හඳුන්වනු ලබන්නේ,

1. අනියම් සේවකයකු ලෙසය
2. පරිවාස සේවකයකු ලෙසය
3. තාවකාලික සේවකයකු ලෙසය
4. ආදේශක සේවකයකු ලෙසය
5. ක්‍රොන්ත්‍රාත් සේවකයකු ලෙසය

(…….)

29. තොරතුරු පද්ධති හා ඒවා භාවිත කරන මට්ටම පිළිබඳ ව පහත වගුවේ දැක්වේ.

තොරතුරු පද්ධති	භාවිත කරන මට්ටම
A - කාර්යාල ස්වයංකරණ පද්ධති	1. උපක්‍රමික මට්ටම
B - තීරණ උපකරණ පද්ධති	2. මෙහෙයුම් මට්ටම
C - විධායක උකපරණ පද්ධති	3. කළමනාකරණ මට්ටම
D - ගනුදෙනු සැකසුම් පද්ධති	4. දැනුම් මට්ටම

ඉහත දැක් වූ තොරතුරු පද්ධති භාවිතා කරන මට්ටම නිසි පරිදි ගැලපූ විට ලබා ගත හැකි නිවැරදි පිළිතුර තෝරන්න.

1. A - 4 , B - 1 , C - 2 , D - 3
2. A - 2 , B - 3 , C - 4 , D - 1
3. A - 4 , B - 3 , C - 1 , D - 2
4. A - 2 , B - 1 , C - 4 , D - 2
5. A - 4 , B - 2 , C - 3 , D - 1

(…….)

30. ව්‍යාපාර සැලැස්මක අංග හා ඒවායේ අන්තර්ගත කරන කරුණු කිහිපයක් පහත දැක්වේ.

ව්‍යාපාර සැලැස්මක අංග	අන්තර්ගත කරුණු
A - අලෙවිකරණ සැලැස්ම	1. තරඟකාරීත්ව විශ්ලේෂණය
B - ව්‍යාපාර විස්තරය	2. ව්‍යාපාරයේ පරමාර්ථ හා අරමුණු
C - ඇමුණුම්	3. ප්‍රවර්ථකයන් පිළිබඳව
D - මෙහෙයුම් සැලැස්ම	4. කළමනාරණ කුසලතා
E - මූල්‍ය සැලැස්ම	5. ණය ආපසු ගෙවීමේ සටහන

ව්‍යාපාර සැලැස්මෙහි අංග හා අන්තර්ගත කරුණු නිවැරදිව සඳහන් කර ඇත්තේ,

1. A , B හා D
2. A , B හා E
3. A , C හා D
4. A , B හා C
5. B , C හා D

(…….)

- ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේදී පතල් හා කැණීම් කර්මාන්තය ..... අංශයට අයත්වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේදී පතල් හා කැණීම් අයත් වන්නේ .... අංශයටයි.

(ආ) ව්‍යාපාරයේ සිටින සියලුම දෙනා අතර බෙදාහදා ගන්නා ඊළඟ පරම්පරාවට පවරාදෙනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, පුරුදු හා හැසිරීම් රටා ..... වන අතර එය .... පරිසර සාධකයකි.

32. (අ) කේවල ස්වාමී ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අදාළ ..... ද ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා වූ වාර්තාව අදාළ ප්‍රදේශයේ ..... ද ලබාගත යුතුය.

(ආ) ඇපයෙන් සීමිත සමාගමක අවම වශයෙන් සාමාජිකයන් ..... සිටිය යුතු අතර උපරිම සාමාජිකයන් ගණන .....

33. (අ) පවතින තත්ත්වයට වඩා උසස් ලෙස භාණ්ඩ නිපදවීමේ හැකියාව ..... වන අතර ලෝකයට වෙනස් දෙයක් ඉදිරිපත් කිරීම ..... ලෙස ද හඳුන්වයි.

(ආ) 2018 මහ බැංකු වාර්තාවට අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ..... නිසා ඇතිවන ආර්ථික පාඩු ආවරණ කිරීමට ..... ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

34. (අ) ව්‍යාපාරිකයෙකුට ණයපතක් ඉදිරිපත් කළ විට එහි ..... හා ණය සීමාව පරීක්ෂා කිරීමට .....යොදා ගැනේ.

(ආ) ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලතම විශ්‍රාම අරමුදල .... වන අතර එහි අරමුදල් කළමනාකරණය කිරීමේ වගකීම .... සතු වේ.

35. (අ) නැවුම් එළකිරි පැකට් කර බෙදාහරින ව්‍යාපාරයක් පවත්වාගෙන යන සී/ස ලක්කිරි සමාගමට, එම කිරිපැකට් පරිභෝජනයෙන් පාරිභෝගිකයාට විය හැකි හානි ආවරණය කරගත හැක්කේ .... රක්ෂණාවරණයක් ලබා ගැනීමෙනි.

(ආ) විදේශ වෙළඳාමේදී විදේශ නිෂ්පාදකයෙකු කෙලින්ම ඇනවුමක් ඉදිරිපත් කර භාණ්ඩ ලබා ගැනීම ..... ලෙසත්, නියෝජිතයෙකු මඟින් භාණ්ඩ ගෙන්වා ගැනීම ..... ලෙසත් හඳුන්වයි.

36. සංවිධානරණයේ පියවරයන් අනුපිළිවෙළින් දැක් වූ විට 1. කාර්ය හඳුනාගැනීම 2. .....
3. ..... 4. අධිකාරිය බලය හා වගකීම් පැවරීම
5. ..... 6. ..... 7. සමායෝජනය වේ.

37. (අ) කාර්ය නිෂ්පාදනයේදී නිෂ්පාදන ක්‍රියාවලියේ ..... දැකිය හැකි වන නමුත් ..... නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලි බවක් දැකිය නොහැක.

(ආ) නිෂ්පාදන ආයතනයක මුළු ආදායමින් විචල්‍ය පිරිවැය අඩු කිරීමෙන් ..... ගණනය කළ හැකි අතර සමච්ඡේද ඒකක සංඛ්‍යාව සෙවීම සඳහා ..... ඒකක දායකයෙන් බෙදිය යුතුය.

38. (අ) අලෙවිකරණ මිශ්‍රයට අයත් සාධක 04 කි. එනම් ..... මිල, බෙදාහැරීම, ... යන ඒවාය.

(ආ) ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණ ..... ලෙස හැඳින්වෙන අතර දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක් මහජනතාව සතුව ඇති කොටස් වෙළඳපොළේ විකිණීමට ඉදිරිපත් කිරීම සඳහා ලැයිස්තුගත කිරීම ..... ලෙස හඳුන්වයි.

39. (අ) කොළඹ කොටස් හුවමාරුවේ පූර්ණ සාමාජිකයන් ලෙස ..... ක්‍රියාත්මක වන අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවේ ..... ලෙස කටයුතු කරයි.

(ආ) සේවා නියුක්තව ඇති අයගේ සඵලත්වය හා කාර්යක්ෂමතාව අත්පත් කර ගැනීම සඳහා .... සිදුකරන අතර සේවකයන්ගේ හැකියාවන්, ආකල්ප, දැනුම ලබා දීම සඳහා ඉවහල්වන්නේ ..... යි.

40. (අ) තොරතුරු පද්ධති පරිශීලනය කරන්නන් ..... වශයෙන් හඳුන්වන අතර එය තොරතුරු පද්ධතියක .....ද වේ.

(ආ) ව්‍යාපාර සැලැස්මක ඉතා වැදගත් කොටස ..... වන අතර එමඟින් බාහිර පාර්ශවයන් තවදුරටත් ව්‍යාපාර පිළිබඳ සොයා බැලීමට පෙළඹේ.

- ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්ණවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

41. 1995 මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් ප්‍රකාශ කර ඇති සමූපකාර ප්‍රතිපත්ති 4 ක ලියන්න.

1. .....
2. .....
3. .....
4. .....

42. හර පතක ඉදිරිපස පෙනුමේ අඩංගු තොරතුරු 04 ක් සඳහන් කරන්න.

1. .....
2. .....
3. .....
4. .....

43. (අ) ශ්‍රී ලංකාවට ගෙන්වන සියළුම මෝටර් රථ ලියාපදිංචි කළ යුත්තේ කුමන ආයතනය යටතේද?

.....

(ආ) ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීම සඳහා යොදා ගන්නා උපකරණ 02 ක් ලියන්න.

1. ..... 2. .....

44. විදේශ වෙළඳාම දියුණු කිරීම සඳහා කටයුතු කරන ආයතන 04 ක් ලියන්න.

1. .....
2. .....
3. .....
4. .....

45. ද්‍රව්‍ය ඵලදායීතාවය වර්ධනය කර ගැනීමට නිෂ්පාදන ආයතනයකට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

1. .....
2. .....
3. .....
4. .....

46. නූතන හුවමාරු ආර්ථිකය යටතේ භාවිතා වන මූලික වෙළඳපොළ වර්ග දක්වන්න.

1. .....
2. .....
3. .....
4. .....

47. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට අයත් මූල්‍ය යටිතල පහසුකම් සඳහා නිදසුන් 04 ක් ලියන්න.

1. .....
2. .....
3. .....
4. .....

48. සෙසු සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතෙහි දැකිය හැකි අද්විතීය ලක්ෂණ 04 ක් ලියන්න.

1. .....
2. .....
3. .....
4. .....

49. යෝජිත අලෙවි උපාය මාර්ග සඳහා ඇතුළත් විය යුතු තොරතුරු 04 ක් දක්වන්න.

1. .....
2. .....
3. .....
4. .....

50. පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

1. 

.....

2. 

.....

3. 

.....

4. 

.....

සියලු ම හිමිකම් ඇවිරිණි

All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

தென் மாகாணத் கல்வித் திணைக்களம்

Department of Education – Southern Province

32 | S | II

Department of Education – Southern Province

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021
General Certificate of Education (Advanced Level) Examination - 2021

තෙවන වාර පරීක්ෂණය - 2021
Third Term Test – 2021

13 ශ්‍රේණිය Grade 13	ව්‍යාපාර අධ්‍යයනය - II Business Studies – II	පැය තුනයි 03 hours

උපදෙස් :

- **'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

"අ" කොටස

01. i. කුසුම් විසින් සේවකයන් පස්දෙනෙකුගෙන් සහය ඇතිව එළවළු හා පළතුරු පැළ තවානක් "ගෙවත්ත" නමින් පවත්වාගෙන යයි. පසුගියදා Covid 19 වසංගතය පැමිණීමත් සමඟ රජය විසින් රටවසා දැමූ අවස්ථාවේ ගෙවතු වගාවට ජනතාව පෙළඹීමත් සමඟ ඇති වූ ඉල්ලුම සපුරාලීමට WhatsApp හා Viber තාක්ෂණය මඟින් ඇණවුම් ලබා ගැනීමටත් ඇඳිරිනීති බලපත්‍රයක් යටතේ ලොරි රථයකින් නිවෙස්වලටම බෙදාදීමට රියදුරුගේද සහය ලබා ගන්නා ලදී.

   අ) ඉහත සිද්ධි අධ්‍යයනයේ සඳහන් ප්‍රධාන මිනිස් අවශ්‍යතා දෙකක් හා ඊට අදාළ වුවමනා දෙකක් සඳහන් කරන්න.

   ආ) පහත සඳහන් පාර්ශවයන් කුසුම්ගේ ව්‍යාපාරයට වැදගත්වන්නේ ඇයිදැයි පැහැදිළි කරන්න.

   1. ගණුදෙනුකරුවෝ 2. සේවකයෝ

ii. ව්‍යාපාරයක බාහිර පරිසරය සාර්ව පරිසරය හා ආසන්න පරිසරය ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

   අ) සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් දෙකක් දක්වන්න.

   ආ) එක් එක් සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවයක් පවතින බව උදාහරණ දෙකකින් පැහැදිළි කරන්න.

iii. "ව්‍යාපාර ආචාරධර්ම වලට පටහැනිව සිදු කරන ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳව විවිධ ජනමාධ්‍යයන් මඟින් නිරන්තරයෙන් අපහට අසන්නට ලැබේ."

   අ) ඉහත ප්‍රකාශය තහවුරු කිරීම සඳහා එවැනි ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

   ආ) ඔබ විසින් නම් කරන ලද ක්‍රියාකාරකම් වලින් ආරක්ෂා වීමට නම් පාරිභෝගිකයා කටයුතු කළ යුත්තේ කෙසේ දැයි පැහැදිළි කරන්න.

iv. අ) රබර් ආශ්‍රිත නිෂ්පාදන නිපදවන ව්‍යාපාරයක් සැලකූ විට එම ව්‍යාපාරය තිරසර සංවර්ධනයට දායක වියයුතු ආකාරය කෙටියෙන් පැහැදිළි කරන්න.

ආ) ශ්‍රී ලංකාවේ රජය නිෂ්පාදන අංශයට වඩා සේවා අංශයේ ව්‍යාපාරවල නියුක්තවීමට වැඩි ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ. මෙම ප්‍රකාශය නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

v. වර්තමානයේදී පාරිභෝගික ආරක්ෂණ වැඩපිළිවෙළ තවදුරටත් දැඩි කිරීමට රජයේ අවධානය යොමු වී ඇත.

අ) මෑත කාලයේදී අතීතයටත් වඩා පාරිභෝගික ආරක්ෂණයේ අවශ්‍යතාව වැඩිවීමට බලපා ඇති හේතු හතරක් සඳහන් කරන්න.

ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට වැදගත්වන ආකාර හතරක් දක්වන්න.

02. i. සුමනසිරි මහතා හට ඔහුගේ පොත් හා ලිපිද්‍රව්‍ය ව්‍යාපාරය සීමා සහිත පෞද්ගලික සමාගමක් ලෙස ආරම්භ කිරීමට පවුලේ අනෙක් අය හා හිතමිතුරන් පැවසුව ද ඔහු එය කේවල ස්වාමී ව්‍යාපාරයක් ලෙස අරඹන ලදි. එයට හේතු ලෙස ඔහු පවසන්නේ පෞද්ගලික සමාගමක් මෙන් නොව කේවල ස්වාමී ව්‍යාපාරවලට කිසිදු නීතිමය බලපෑමක් නොමැති වීමය.

සුමනසිරි මහතාගේ එම ප්‍රකාශය හා ඔබට එකඟ විය හැකිද? පිළිතුර හේතු සහිතව පැහැදිළි කරන්න.

ii. අ) පහත දැක්වෙන්නේ ඔබ ප්‍රදේශයේ පවතින සීමාසහිත සමාගම් දෙකක් නම්,

- සීමාසහිත මදූ ෆැෂන්ස් සමාගම
- සීමාසහිත කුමුදු ඇපරල්ස් (පොදු) සමාගම

මෙම සමාගම් දෙක අතර ප්‍රධාන වෙනස සඳහන් කරන්න.

ආ) පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ හතරක් ලියන්න.

iii. ජනතාවට අවශ්‍ය නිෂ්පාදන රාජ්‍ය ආයතන මඟින් ලබා දීමට රජය කටයුතු කරන අතර ඒ සඳහා විවිධ ව්‍යාපාර සංවිධාන රජය විසින් පවත්වාගෙන යනු ලබයි.

අ) රජය විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සංවිධාන වර්ග හතරක් නම් කරන්න.

ආ) රජය එලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපාන හේතු මොනවාද?

iv. අ) ඔබ ප්‍රදේශයේ ඇති සාර්ථක ව්‍යවසායකයෙකු හඳුනාගෙන ඔහුගේ ව්‍යවසායකත්ව සාර්ථකත්වයට හේතු වූයේ යැයි ඔබ සිතන්නේ කුමන සාධක දැයි පැහැදිළි කරන්න.

ආ) ව්‍යවසායකත්ව ගතිලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාරයක් ලෙස ස්වයං ඇගයීම කෙසේ වැදගත් වේ දැයි පැහැදිළි කරන්න.

v. අ) "ස්වාධීන අයිතිය හා ස්වාධීනව ක්‍රියාත්මකක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ."

ඉහත සඳහන් වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිර්වචනයකි. එහි සඳහන් වන අන්දමට ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර ලෙස හඳුන්වන්නේ ඇයිදැයි පැහැදිළි කරන්න.

ආ) රටක පවතින ව්‍යාපාර අතරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙන්කර හඳුනාගත යුත්තේ ජාතික නිෂ්පාදිතයට එමඟින් ලැබෙන දායකත්වය හා සම්පත් භාවිතය වැනි දත්ත ලබා ගැනීමට පමණි. සාකච්ඡා කරන්න.

03. i. අ) ආනයනික දුරකථන අලෙවි සැලකින් තමාට අවශ්‍ය දුරකථනයක් මිලදී ගත් මලිත ඉන් අඩක් එම අවස්ථාවේදීම ගෙවූ අතර ඉතිරි මුදල වාරික පහකින් ගෙවීමේ එකඟතාවය යටතේ ඊට අදාළ වගකීම් සහතිකය ද ලබා ගත්තේය.

ඉහත සිදුවීමට අනුව මුදලේ කාර්යයක් වන විලම්භිත ගෙවීම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම ඔබ පැහැදිළි කරන්නේ කෙසේද?

ආ) විද්‍යුත් මුදල් භාවිතයේදී ඒවාට අවශ්‍ය විවිධ පහසුකම් මූල්‍ය ආයතන මඟින් සපයා ඇත. එවැනි පහසුකම් හතරක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිළි කරන්න.

ii. අ) ඒකක භාර අරමුදල් විවිධ ආයෝජන ක්ෂේත්‍රවල (ආයෝජන කළඹක) ආයෝජනය කරනු ලබයි. එවැනි ක්ෂේත්‍ර හතරක් සඳහන් කර ඒකක භාර වල ආයෝජනයෙන් ආයෝජකයාට ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා විවිධ ආකාරයේ පහසුකම් ස්ථාපිත කොට ඇත. මහ බැංකුවේ එවැනි කටයුතු හතරක් සඳහන් කර ඉන් ව්‍යාපාර වලට ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

iii. වර්තමානයේ සෑම වාණිජ බැංකුවක්ම පාහේ අන්තර් ජාල බැංකු කටයුතු තම ගණුදෙනුකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියා කරමින් සිටියි.

යම් පුද්ගලයෙකුට තම ඉතුරුම් ගිණුමෙන් තවත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට කිසියම් මුදල් ප්‍රමාණයක් ගෙවීමට අවශ්‍ය යැයි සිතන්න. අන්තර්ජාල බැංකු කටයුතු මඟින් එය ඉටුකරන ආකාරය පෙන්වා දෙන්න.

iv. අ) කසුන්ගේ මෝටර් රථය අනතුරකට පත්වීමෙන් රු. 1 500 000 ක අලාභයක් සිදු විය. මෙම මෝටර් රථය රු. 4 500 000 වටිනා අතර එය රු. 3 500 000 ක්ම ABC රක්ෂණ සමාගමෙන් රක්ෂණය කර ඇත.

අනතුරෙන් සිදු වූ අලාභය රක්ෂණ සමාගම් දෙකෙන්ම සම්පූර්ණ වශයෙන් ලබා ගැනීමට කසුන් අපේක්ෂා කරයි. ඔහුට එම වන්දි ලබා ගත හැකිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

ආ) ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ගින්නට අමතරව ලබාගත හැකි අවදානම් හතරක් ලියන්න.

v. අ) පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන විද්‍යුත් සන්නිවේදනය සඵලදායකත්වය කෙරෙහි බලපෑ හැකි බාධා හතරක් සඳහන් කරන්න.

ආ) සන්නිවේදන ක්‍රියාවලියේදී විද්‍යුත් තැපෑල පුද්ගලයන් හා ව්‍යාපාරික ප්‍රජාව අතර බෙහෙවින් ජනප්‍රිය වේ. මෙසේ ජනප්‍රිය වීමට හේතු මොනවාද?

04. i. අ) එළවළු හා පළතුරු ප්‍රවාහනය සඳහා දුම්රිය ප්‍රවාහනයට වඩා මහා මාර්ග ප්‍රවාහනය සුදුසුය. හේතු හතරක් සඳහන් කරන්න.

ආ) ප්‍රවාහන පද්ධතියක මූලිකාංග හා ඒවාට අයත් විවිධ දේ සඳහන් කරන්න. (එක් මූලිකාංගයකට අයත් දේවල් දෙක බැගින්)

ii. සැපයුම් හා ව්‍යාපාර සේවා වර්ධනයට යොදා ගත හැකි පද්ධති හතරක් සඳහන් කරන්න.

iii. අ) නිෂ්පාදිත බෙදාහැරීමේදී අතමැදියන් යොදා ගැනීමෙන් නිෂ්පාදකයාට ඇතිවෙන වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න.

ආ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අන්තරාල වෙළෙඳාමට වඩා ප්‍රතිඅපනයන වෙළෙඳාම වැදගත් බවට හේතු දෙකක් පෙන්වා දෙන්න.

iv. අ) දැඩි තරඟකාරීත්වයට මුහුණ දී සිටින සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දෙකු වන සුපුන්ට තම වෙළෙඳ සැලවෙත පාරිභෝගිකයන් අද්දවා ගැනීමට යොදා ගත හැකි උපාය මාර්ග මොනවාද?

ඇ) ජාත්‍යන්තර වෙළෙඳාම සෑම රටකටම අත්‍යවශ්‍ය දෙයක් බවට පත්ව ඇත. හේතු පැහැදිළි කරන්න.

v. ආනයන හා අපනයන වෙළඳාමේදී භාවිතා වන පහත සඳහන් ලියවිලි හඳුන්වන්න.

1. නැංගුරපත
2. අපනයන සටහන්කරය
3. ණයවර ලිපිය
4. ප්‍රභවස්ථාන සහතිකය

"ආ" කොටස

05. i. අ) කළමනාකරණය යනු කුමක් දැයි හඳුන්වන්න.

ආ) සඵලදායකත්වය, කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වය යන සංකල්ප වෙන වෙනම පැහැදිළි කරන්න.

ii. ප්‍රියලාල් එළවළු ව්‍යාපාරිකයෙකි. ඔහු සතුව ලොරි රථ දෙකක් ඇත. උඩරට එළවළු නිෂ්පාදකයින්ගෙන් එළවළු තොග වශයෙන් ලබා ගෙන කොළඹ ප්‍රදේශයේ ව්‍යාපාරය පවත්වා ගෙන යයි. වර්තමාන කොරෝනා වෛරස ව්‍යාප්තිය හේතුවෙන් ඔහුට එම ව්‍යාපාරය එම ප්‍රදේශය තුළ සාර්ථකව කර ගෙන යාමට දුෂ්කර වී ඇති නිසා පාර්භෝගිකයා ළඟට එළවළු ගෙනගොස් අලෙවි කිරීමේ කටයුත්තට යොමු වීමට ප්‍රියලාල් අපේක්ෂා කරයි. ඔහු සතු ලොරි රථ දෙක මෙයට ප්‍රමාණවත් නෙවෙන බව ප්‍රියලාල් අවබෝධ කර ගෙන ඇත. එමනිසා එම ගැටලුවට විකල්ප දෙකක් ඔහු සතුව ඇත.

1. අලුතින් ලොරියක් මිලදී ගැනීම.
2. කුලී පදනමට ලොරියක් ලබා ගැනීම.

මෙම එක් එක් විකල්පයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

iii. අ) සේවකයන් වැඩට පොළඹවා ගැනීම සඳහා අනුගමනය කරන මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම හතරක් ලියන්න.

ආ) පාලන ක්‍රියාවලියට අයත් පියවරයන් ලියන්න.

iv. ව්‍යාපාර ආයතනයක නිෂ්පාදන පිරිවැය විවිධ අයුරින් වර්ග කළ හැකිය. භාණ්ඩයක නිෂ්පාදනය සඳහා සෘජුවම වැයවන විවිධ පිරිවැය මෙන්ම භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා වක්‍රව වැයවන පිරිවැයක් ද ඇත. ඒවා සෘජු පිරිවැය හා වක්‍ර පිරිවැය ලෙස හඳුන්වයි.

අ) පිරිවැය වෙනස්වීමේ ස්වභාවය මත ආයතනයක පිරිවැය වර්ග කර නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න.

ආ) සහභාගය යන්න හඳුන්වා එමඟින් ව්‍යාපාර ආයතනයකට කවර කාර්යයක් ඉටු කරයි ද යන්න පැහැදිළි කරන්න.

v. "ව්‍යාපාර ආයතනයක සමච්ඡේද ලක්ෂය ගණනය කිරීමෙන් අත්වන ප්‍රතිලාභ එම ව්‍යාපාරයේ ලාභ ලැබීම ආරම්භ වන නිෂ්පාදන මට්ටම හෝ විකුණුම් මට්ටම හඳුනා ගැනීම පමණි."

ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිළි කරන්න.

06. i. එක්තරා ව්‍යාපාරයක තොග සම්බන්ධ දත්ත අයිතමයකට අදාළ කරුණු පහත දැක්වේ.

අවම දත්ත පරිභෝජනය දිනකට ඒකක	30
උපරිම දත්ත පරිභෝජනය දිනකට ඒකක	80
යලි ඇනවුම් කාලය අවම දින	8
යලි ඇනවුම් කාලය උපරිම දින	16
යලි ඇනවුම් ප්‍රමාණය ඒකක	4 000

අ) ආයතනයේ යලි ඇනවුම් මට්ටම ගණනය කරන්න.

ආ) ආයතනයේ උපරිම තොග මට්ටම ගණනය කරන්න.

ii. කොවිඩ් 19 සමයේ අධ්‍යයන කටයුතු Online ක්‍රමයෙන් සිදු කළ යුතු වූ බැවින් ගණිත විෂය ධාරාව හදාරන නුවන් සිංගර් ආයතනයෙන් ලැප්ටොප් එකක් මිලදී ගැනීමට තීරණය කළ අතර වෙළෙඳපොළේ නිෂ්පාදිත සීමිත වූ බැවින් ඒවායේ මිල ද වැඩි වී තිබූ අවස්ථාවක වුවද හොඳම තත්ත්වයේ Dell ලැප්ටොප් එකක් මිලදී ගත් නුවන් ඒ සඳහා වසරක වගකීම් සහතිකයක් ඇති බවත් අලෙවියෙන් පසු සේවා සපයන බවත් තම මිතුරු රුවන් සමඟ සතුටින් පැවසීය. වාණිජ විෂය ධාරව යටතේ උසස් පෙළ හදාරන රුවන්ට තම මිතුරාගේ ප්‍රකාශය තුලින් අලෙවි කළමනාකරණය පාඩමේදී තමා ඉගෙනගත් හර සංකල්ප දෙකක් සිහියට නැඟුණි.

අ) රුවන්ට සිහිපත් වූ අලෙවිකරණ හර සංකල්ප මොනවාද?

ආ) රුවන්ට සිහිපත් වූ අලෙවිකරණ හර සංකල්ප දෙකක් පැහැදිළි කරන්න.

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

iii. අ) වෙළඳපොළ බණ්ඩනයේ පදනම් 04 ක් සඳහන් කරන්න.

ආ) වෙළඳපොළ බණ්ඩනයේ ප්‍රායෝජන 04 ක් ලියන්න.

iv. අ) සන්නමකින් ව්‍යාපාරිකයාට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.

ආ) ඇසුරුම මට්ටම් තුනකින් හඳුනාගත හැකිය. එම මට්ටම් නම් කර උදාහරණ සහිතව පැහැදිළි කරන්න.

v. සීමා සහිත සමාගමක 2020/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයකින් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	250 000	ස්ථාවර වත්කම්	450 000
12% වරණීය කොටස් ප්‍රාග්ධනය	128 000	බඩු තොගය	60 000
10% ණයකර	100 000	ණයගැතියෝ	15 000
ණයහිමියෝ	50 000	මුදල් ශේෂය	23 000
ගෙවිය යුතු වියදම්	20 000		
	548 000		548 000

අ) මෙම සමාගමේ බාහිර මූල්‍ය සම්පාදන මාර්ග 02 ක් ලියා දක්වන්න.

ආ) දළ කාරක ප්‍රාග්ධනය හා ශුද්ධ කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න.

07. i. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරුවන් ගත් තීරණ කිහිපයකි.

- රථවාහන අංගනයක් ඉදිකිරීම
- තොග මිළ දී ගැනීම
- ණය ආපසු අයකර ගැනීමේ කාලය අඩු කිරීම
- නව දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීම
- නව ව්‍යාපාර ශාඛාවක් විවෘත කිරීම
- සුළු මුදල් අග්‍රිමය වැඩි කිරීම

අ) ඉහත තීරණ කෙටි කාලීන හා දිගු කාලීන ආයෝජන තීරණ වශයෙන් වෙන් කර දක්වන්න.

ආ) ව්‍යාපාරය සතු අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

ii. අ) සෘජු මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි හා සීමා 02 බැගින් දක්වන්න.

ආ) මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් දක්වන්න.

iii. අ) රැකියා නිර්මාණය (Job Design) යනු කුමක්ද?

ආ) රැකියා ඇබෑර්තු පිරවීම සඳහා ඉතාම සුදුසු පුද්ගලයා තෝරා ගැනීමට භාවිතා කළ හැකි ක්‍රම හතරක් නම් කරන්න.

iv. "සංවිධානයක තනතුරු සඳහා අවශ්‍ය සේවකයින් ආයතනයේ අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිරින් ද බඳවා ගනියි."

අ) සේවකයන් බඳවා ගැනීමේ දී යොදාගන්නා අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම 04 ක් නම් කරන්න.

ආ) බාහිරින් ද සේවකයන් ආකර්ෂණය කර ගැනීමෙන් ව්‍යාපාර ආයතනයකට විය හැකි අවාසි හතරක් සඳහන් කරන්න.

v. අ) වෘත්තීය සමිතියක අරමුණු හතරක් ලියන්න.

ආ) මානව සම්පත් කළමනාකරණයේ සාර්ථකත්වය ඇගයීමේ නිර්ණායක දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. i. අ) දත්ත, තොරතුරු හා තොරතුරු පද්ධති අතර පවතින සබඳතාව විස්තර කරන්න.

ආ) දත්ත තොරතුරු බවට පත් කිරීමේ මූලිකාංග 04 ක් නම් කරන්න.

ii. අ) "කළමනාකරණ තොරතුරු පද්ධති" යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

ආ) අන්තර්ජාල පරිශීලයකුට සෙවුම් යන්ත්‍රයක් ප්‍රයෝජනවත් වන්නේ ඇයි දැයි සඳහන් කරන්න.

iii. තොරතුරු තාක්ෂණයේ වැදගත්කම කරුණු 04 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

iv. අ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී ව්‍යාපාරිකයන් අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

ආ) ව්‍යාපාර ආරම්භ කිරීමට පෙර දැරීමට සිදු වන මෙහෙයුම් වියදම් නම් කරන්න.

v. අ) මූල්‍ය සැලැස්මක අන්තර්ගත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක මුදල් ගලාඒම් හා ගලායාම් සඳහා නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න.

ආ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීම නව ව්‍යාපාරයකට මෙන් ම ව්‍යාපාර පුළුල් කිරීමේ දී , ඒකාබද්ධ කිරීමේ දී හා නවීකරණයේ දී සිදු කළ හැකිය. මෙසේ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පොත් 3 ක් ගත්තොත්,



1 ක්



25%
දක්වා වට්ටම්
හිමිකරගන්න.

නොමිලේ.

හොඳම පොත් අඩුම මිලට අපෙන් විතරමයි...

Atlas
Richard
RATHNA EXERCISE BOOKS

දැන්ම lol.lk වෙත පිවිසෙන්න

CASH ON DELIVERY | VISA | mastercard | KOKO

LOL.LK
LOL STORE (PVT) LTD

COD
CASH ON DELIVERY

037 20 60 110
071 77 74 440